# ආගමන සමයේ දෙවන සතිය
# සිකුරාදා

| | |
|---|---|
| **පළමුවන කියැවීම** | **යෙසායා 48: 17-19** |

යෙසායා දිවැසිවරායාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

*නුඹලා මාගේ ආඥාවලට සවන් දුන්නහු නම්!*

නුඹලාගේ මිදුම්කාරයාණන් ද ඉශ්රායෙල්වරුන්ගේ සුවිශුද්ධ තැනැත්වහන්සේ ද වන සමිඳාණෝ මෙසේ වදාරණ සේක.

"නුඹලාගේ යහපත පිණිස නුඹලා ට උගන්වන, යා යුතු හරි මග නුඹලා ට පෙන්වන, නුඹලාගේ දෙවි සමිඳාණෝ මම ය. නුඹලා මගේ ආඥාවලට සවන් දුන්නහ නම්, මාගේ ආශිර්වාදය නොසිඳී ගලන ගඟක් සේ නුඹලා කරා ගලා එන්නේ ය. මුහුදේ රළ පතර මෙන් දැහැමිකම නුඹලා වෙත පැමිණෙන්නේ ය. නුඹලාගේ දරු පරම්පරාව වැලි ඇට මෙන් බහුල වන්නෝ ය. ඔවුන්ගේ නම මැකී යන්නේ වත්, මා ඉදිරියෙහි ඔවුන් කිසි කලක විනාශ වන්නේ වත් නැත.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 1: 1–4, 6 |
|---|---|

පිළිතුර: සමිඳුනි, ඔබ අනුගාමී වන්නෝ ජීවිතයේ ආලෝකය ලබන්නෝ ය.

ගීය: දුදනන් උපදෙස් අනුව නොයන,
දෙවිඳුන් ගරහන්නන් ඇසුරු නොකරන,
සමිඳුන්ගේ විනයෙහි ප්‍රීති ප්‍රමුදිත වන,
දිවා රෑ එය භාවනා කරන මිනිසා භාග්‍යවන්තයෙක් වන්නේ ය.

ඔහු ඇළ දොළ අද්දර සිටුවා ඇති,
නියම කලට පල දරන,
කොළ පරවී නොයන ගසකට සමානය.
ඔහු කරන සෑම දේ සරු සාර වේ.

පව්ටු දනෝ එසේ නොවෙයි.
ඔව්හු සුළඟේ යන බොල් හා සමාන වන්නෝ ය.
දම්ටුන් හට සමිඳාණෝ සරණ වන සේක.
පව්ටුන්ගේ මාර්ගය විනාශයට යන්නේ ය.

| සුපුවත් ජය නද |
|---|

ආලේලූයා! ආලේලූයා!
බලන්න, ලෝකයේ සමිඳාණන් වූ රජාණෝ වඩින්නාහ.
එතුමාණෝ අපේ වහල් බවින් අප මුදා හරින්නාහ.
ආලේලූයා!

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

*ඔව්හු ජුවාමිට වත් මනුෂ්‍ය පුත්‍රයාණන්ට වත් සවන් නුදුන්නෝ ය.*

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙසේ වදාළ සේක. “මේ පරම්පරාව කුමකට සමාන කරම් ද? වෙළඳ පොළේ හිඳ තමන්ගේ යහළුවන්ට හඬ ගා ‘අපි ඔබට නළා පිම්බෙමු, ඔබ නැටුවේ නැත, අපි ඔබට විළාප කීමු, ඔබ හැඬුවේ නැත’ කියන දරුවන්ට එය සමානය. ජුවාම් කමින් බොමින් ආවේ නැත. එබැවින්, ‘ඔහු යක්ෂාවේශ වූවෙකි’ යි ඔව්හු කියති. මනුෂ්‍ය පුත්‍රයාණෝ කමින් බොමින් ආ සේක. එබැවින් ‘බලන්න, ඔහු කෑදර මනුෂ්‍යයෙකි. මුද්‍රික පානය බොන්නෙකි. අයකැමියන්ගේ ද පව්කාරයන්ගේ ද යහළුවෙකි’ යි ඔව්හු කියති. එහෙත් දෙවියන් වහන්සේගේ ප්‍රඥාව නිවැරැදි බව එහි ක්‍රියා වලින් ඔප්පු වී ඇත.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*